**#mediaethicsSL #SinhalaPress #lka #Mawbima #July09**

මව්බිම පුවත්පතෙහි රේගු නිලධාරීන්ට හිමිවන ප්‍රතිලාභ සම්බන්ධයෙන් 'ගැහිල්ල' යන වචනය භාවිතා කරමින්, එය මූල්‍ය වංචාවක් ලෙසින් ගම්‍යමාන කරමින් පළවූ ප්‍රවෘත්තියක් අප විසින් මින් පෙර ප්‍රශ්න කරන්නට යෙදිණි. කෙසේ හෝ මේ සම්බන්ධව රේගු නිලධාරීන්ගේ සංගමය මගින් පුවත්පත වෙත කරුණු පැහැදිලි කිරීමෙන් පසුව, මව්බිම විසින් ඒ බව ප්‍රකාශ කරමින් නිවැරදි කිරීමක් ප්‍රකාශ කොට තිබේ. සැබවින්ම සිය වැරදීම නිවැරදි කර නොගනිමින් නිහඬව හිඳිනවාට වඩා එය ප්‍රශංසනීය වේ.

නමුත් එම නිවැරදි කිරීම ප්‍රමාණවත්ද යන ගැටළුව පැන නගී. මුල් පුවතේදී ඔවුන් නොමග යවන සුළු සිරස්තලයක් භාවිත කරමින් පැහැදිලිවම මාධ්‍ය ආචාර ධර්මයක් උල්ලංඝනය කොට තිබේ. එය රේගු නිලධාරීන්ගේ සංගමය මගින් දැන්වීමෙන් පසුව පළ කරනා නිවැරදි කිරීමේදී තමන් පළ කරන්නට යෙදුණු සිරස්තලය සාවද්‍ය බව පිළිගෙන නොමැත්තේ මන්ද? ඒ සඳහා කණගාටුව ප්‍රකාශ කිරීමක් නොමැත්තේ මන්ද? වඩාත් ආචාර ධාර්මික 'නිවැරදි කිරීමේ ප්‍රකාශයක්' වන්නේ එය නොවේද?